**ලංසු සඳහා ආරාධනයයි**

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

**<u>ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට දෙපාර්තමේන්තුවට අයත් කුරුවිට නගරයේ වාණිජ ගොඩනැගිලි හා රථගාල ගිවිසුමකට අනුව වසර පහක කාලසීමාවක් සඳහා බදුලබාදීම සඳහා ප්‍රසම්පාදන කමිටු ලංසු කැඳවීමයි.</u>**

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් පහතින් දක්වා ඇති කුරුවිට නගරයේ වාණිජ ගොඩනැගිලි හා රථගාල වසර 05ක කාලයකට බදු ලබාදීම පිනිස ලංසු කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ප්‍රසම්පාදන ලංසුපත් කැඳවනු ලැබේ.

| විස්තරය | ප්‍රමාණය (පර්චස්) |
|---|---|
| ගොඩනැගිලි අංක I | 5 |
| ගොඩනැගිලි අංක II | 10 |
| රථගාල (කැ.අ 1,2,3,4, 9) | 55.3 |

ඉහත සඳහන් ගොඩනැගිලි හා රථගාල් පිළිබඳ විස්තර ප්‍රසම්පාදන ලියවිලි යටතේ උපලේඛණ 01 හි දක්වා ඇත.

**<u>01.සුදුසුකම්</u>**

දෙපාර්තමේන්තු කොන්දේසි වලට යටත්ව වැඩිම මිල ගණන් ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්කරුට අදාල ගොඩනැගිලි හා රථගාල් වෙන් වෙන්ව බදු ලබාදීම කටයුතු කරනු ඇත.

**<u>02.ලංසු අයදුම්පත්‍ර ලබාගැනීම</u>**

ප්‍රසම්පාදන ලියවිලි 2024 සැප්තැම්බර් මස 25 වන දින ප.ව.2.00 දක්වා දුම්රිය වෙළඳ හා අලෙවි කාර්යාලයෙන් ලබා ගත හැක. ඒ සඳහා කොළඹ 10 ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ප්‍රධාන මුල්‍ය නිලධාරි වෙත ආපසු ගෙවනු නොලබන ලංසු පෝරම ගාස්තුව ලෙස රු.2,500/- ක මුදලක් ගෙවා ලබා ගන්නාලද ලදුපත දුම්රිය මූලස්ථානයේ නියෝජ්‍ය අධිකාරී (වෙළඳ හා අලෙවි) වෙත ඉදිරිපත් කළ යුතුය. ලංසු අයදුම්පතෙහි උපලේඛණ 01 හි සඳහන් එක් එක් ගොඩනැගිලි හා රථගාල සඳහා වෙනම සළකා ලංසු ඉදිරිපත්කළ යුතු අතර, ලංසු පෝරම ගාස්තුවට අමතරව එම ලේඛණයේ දක්වා ඇති පරිදි ආපසු ගෙවනු ලබන ලංසු බැදුම්කරයක්ද ගෙවිය යුතුය. එක් ලංසු පෝරමයක් මගින් ලංසු ඉදිරිපත්කල හැක්කේ එක් අයිතමයක් සඳහා පමනි.

**<u>03. ලංසු අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම</u>**

ඉහත 02 යටතේ සඳහන් ආකාරයට ලබාගන්නා ලද ලංසු අයදුම්පත්‍ර මුල් පිටපත හා අනු පිටපත නිසි පරිදි සම්පූර්ණ කර කවර දෙකක බහා මුද්‍රා තැබිය යුතුය. එම කවරවල මුල් පිටපත හා අනු පිටපත ලෙස පැහැදිලිව සඳහන් කළ යුතුය. එම කවර දෙක තනිකවරයක බහා වම් පස ඉහල කෙළවරේ "කුරුවිට වාණිජ ගොඩනැගිලි / රථගාල සඳහා මිල ගණන් කැඳවීම " යනුවෙන් සඳහන් කොට, එම කවරය මුද්‍රා තබා 2024 සැප්තැම්බර් මස 26 වන දින ප.ව 02.00 පෙර ලැබෙන සේ සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, වෙළඳ හා අලෙවි කාර්යාලය, දුම්රිය මූලස්ථානය, ඕල්කට් මාවත, කොළඹ 10 ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ දුම්රිය මූලස්ථාන නියෝජ්‍ය අධිකාරී (වෙළඳ හා අලෙවි) ගේ නිල කාමරයෙහි ටෙන්ඩර්පත් බහාලීම සඳහා සකසා ඇති විශේෂ ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හෝ කටයුතු කළ යුතුය. එම වේලාවෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී ප්‍රමාදවූ හා නැතිවූ අයදුම්පත් පිළිබඳව සලකා බලනු නොලැබේ.

**<u>04. ලංසු භාරගැනීම හා විවෘත කිරීම</u>**

2024 සැප්තැම්බර් මස 26 වන දින ප.ව.2.00 ට ඉහත 03 ඡේදයේ දක්වා ඇති පරිදි වෙළඳ හා අලෙවි කාර්යාලයේදී අයදුම්පත් විවෘත කරනු ලබන අතර, එම අවස්ථාවට අයදුම්කරුට හෝ ඔහුගේ බලයලත් එක් නියෝජිතයෙකුට සහභාගී වීමට ඉඩදෙනු ලැබේ.

**05.** දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

**06.** ලංසුකරුවන්ට වැඩි විස්තර අවශ්‍ය නම් දුරකථන අංක :-011-2421281 – (දිගු අංකය -8235) 0114-600944 හරහා ශ්‍රී ලංකා දුම්රිය සේවයේ වෙළඳ හා අලෙවි කාර්යාලය වෙතින් ලබාගත හැක.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
දුම්රිය මූලස්ථානය, ඕල්කට් මාවත, කොළඹ 10.